# රත්නපුර ජාතික කෞතුකාගාරය

## ලංසු කැඳවීමයි

# ආපන ශාලාව පවත්වාගෙන යාම

1. අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රී ලංකා ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව විසින් 2023 වර්ෂය සඳහා මෙම ආයතනයේ ආපන ශාලාව පවත්වාගෙන යාම වෙනුවෙන් පහත සුදුසුකම් පසුරා ඇති ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

   - පසුගිය ආසන්න වසර 02 ක කාලය තුළ රජයේ හෝ රජයට අනුබද්ධිත ආයතන දෙකක අවම වශයෙන් අඛණ්ඩව වසරක් බැගින් හෝ අඛණ්ඩව එක් ආයතනයක වසර 02 ක සතුටුදායක සේවා කාලයක් ආපන ශාලා පවත්වා තිබිය යුතුය.
   - රජයේ කොන්ත්‍රාත් කොන්දේසි කඩකර අසාධු ලේඛනගත නොවී තිබිය යුතුය.

2. ලංසු ලියවිලි ගාස්තු වශයෙන් ආපසු නොගෙවනු ලබන රු.3,000/- ක මුදල ආයතනයේ සරප් වෙත මුදලින් ගෙවා ආයතනයේ පාලන අංශය වෙතින් 2023.08.14 දින සිට 2023.08.28 දින දක්වා සතියේ දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා ලංසු කියවිලි ලබාගත හැකි අතර ලංසු ලියවිලි ගාස්තු ගෙවීමකින් තොරව පාලන අංශ කාර්යාලයේ දී පරීක්ෂා කිරීමට හැකිය.

3. ලංසු භාරගන්නා අවසන් දිනය 2023.08.28 දින ප.ව. 1.00 වේ. එම වේලාවෙන් පසුව ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලබන අතර ලංසු භාරගන්නා වේලාව අවසන් වූ වහාම එකී ලංසු විවෘත කිරීමට කටයුතු කරනු ලැබේ. එම අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගි විය හැක.

4. මුද්‍රා තැබූ ලංසු නියමිත දින අදාළ වේලාවට පෙර ලැබෙනසේ සභාපති දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව ශ්‍රී ලංකා ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව 53, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනැවිත් ආයතනයේ ප්‍රසම්පාදන අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැක. **ලංසුපත් ඉදිරිපත් කරන කවරයේ වම් පස ඉහල කෙළවර රත්නපුර ජාතික කෞතුකාගාරයේ ආපන ශාලාව පවත්වාගෙන යාම** සඳහා මිල ගණන් කැඳවීම යනුවෙන් සඳහන් කළ යුතුය.

   වැඩි විස්තර දුරකථන අංක 011 2692092 මඟින් අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන) ඇමතීමෙන් ලබාගත හැක.


**සභාපති - දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව**
**ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව**
**53, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත**
**කොළඹ**

**දුරකථන අංක - 011 20694767**
**ෆැක්ස් - 011 2692092**
**ඊ -මේල් - nmdep@slt.lk**